# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

**53 A, ඩී.එස්.ෆොන්සේකා පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා**

දුරකථන / ෆැක්ස් : 2556629 ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com වෙබ් අඩවිය : www.slpia.lk


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/214/20. ඔබේ අංකය :

2020.10.22

සී.ඩී. වික්‍රමරත්න මහතා,
වැඩබලන පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

<u>උප පොලිස් පරික්ෂක තනතුරේ නිලධරයන්ගේ උසස්වීම් සම්බන්ධව.</u>

දීර්ඝ කාලයක් උසස්වීම් නොලබා සිටි පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන් හට අදියර 03 ක් යටතේ උසස්වීම් ලබා දීමට ඔබතුමා ගත් උත්සහයට නැවත වරක් ස්තුතිවන්ත වන අතර, පොලිස් පරීක්ෂකවරුන් එම අදියර 03ට පරිබාහිරව වසර 10 ක සක්‍රීය සේවා කාලය ගණනය කරමින් උසස් කිරීමට ගත් උත්සහයද කෘතවේදීව සිහිපත් කරමු.

අප සංගමයේ සාමාජිකත්වයෙන් වැඩි ප්‍රතිශතයක් උප පොලිස් පරීක්ෂක වරුන් විසින් ලබා ඇති අතර, මේ වන විට 2011 සහ 2012 වසරේදී නිත්‍ය සේවයට ඉදුරාම බඳවාගත් ආධුනික උපපොලිස් පරීක්ෂක වරුන් සහ වරියන් සිය උසස්වීම් අපේක්ෂාවෙන් සංගමයේ මැදිහත්වීම අවස්ථා ගණනාවකදී අපේක්ෂාකර තිබූ බැවින් ඒ පිළිබඳව මීට ඉහතදී ඔබතුමා දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

මේ වන විට පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන් සඳහා වූ බඳවා ගැනීමේ සහ උසස්කිරීමේ පටිපාටිය (SOR) සකස්කර අවසන් නොමැති බැවින්, ඉහත උප පොලිස් පරීක්ෂක නිලධරයන් හට පොලිස් පරීක්ෂක තනතුර සඳහා වූ උසස්වීම් ලබා ගැනීම පිළිබඳව ගැටළුවකට මුහුණ දී ඇත. යෝජිත පටිපාටිය තුල උප පොලිස් පරීක්ෂකවරයෙකුට සිය සේවා කාලය වසර 05ක් සම්පූර්ණ වූ විට පොලිස් පරීක්ෂක නිලය සඳහා තරග විභාග සඳහා පෙනී සිටීමටත්, වසර 08 ක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු සේවා කාලය මත පදනම්ව පොලිස් පරීක්ෂක නිලයට උසස්වීමටත් අවස්ථාව ලබා දීමට තීරණය කර ඇත,

කරුණු එසේ හෙයින් ඉදුරාම බඳවාගත් උප පොලිස් පරීක්ෂක නිලධරයන් සිය සේවා කාලය වසර 08 ක් ඉක්මවා තිබියදීත් සිය උසස්වීම් ලබා ගැනීමට කිසිදු අවස්ථාවක් නොලැබීම පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවදානය යොමුකර, 2020.07.03 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේදී ආරක්ෂක ලේකම් තුමා සමග පැවති සාකච්ඡාවේදී අප සංගමය විසින් කල ඉල්ලීම පදනම් කර ගනිමින් පොලිස් පරීක්ෂකවරුන් ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලයට උසස් කිරීම සඳහා අනුගමනය කල ක්‍රමවේදය මත හිදිමින් උප පොලිස් පරීක්ෂක නිලධරයන් පොලිස් පරීක්ෂක නිලයට කඩිනමින් උසස් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටිමු.

ශ්‍රී ලංකා පොලිස් පරික්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි,
නීතිවේදී (ගෞරව),
පොලිස් පරික්ෂක,
ලේකම්,
පොලිස් පරික්ෂක වරුන්ගේ සංගමය.

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි
නීතිවේදී (ගෞරව)
ගරු ලේකම්,
ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

පිටපත - 1. ආරක්ෂක ලේකම්තුමා / ආරක්ෂක අමාත්‍යාංශය. (කාරුණික දැන ගැනීම සඳහා)
2. ලේකම්තුමා / ජාතික පොලිස් කොමිෂන් සභාව (කාරුණික දැන ගැනීම සඳහා)